# ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ හේතු සාධක පිළිබඳ විමසුමක්

විල්ගමුවේ පියනන්ද හිමි[1], ආර්. එම්. ජී. වසන්ත දිසානායක

## හැඳින්වීම

'ආගම' මානවයාගේ ලෞකික හා ලෝකෝත්තර ජීවිත නිවැරදි දිශානතියකට යොමු කරයි. එනිසා ම ශිෂ්ටාචාරගත වූ මානවයා සිය ජීවිත ආලෝක කර ගැනීම සඳහා විවිධ ආගමික විශ්වාසයන්ට අනුගතව කටයුතු කරති. සිය දහස් ගණන් වූ ආගමික සම්ප්‍රදායන් ඇතැම් විට සිය ජීවිත කරගත් මිනිස් සමාජයන් නූතන ලෝකය තුළ ද දැකගත හැකි කරුණකි. ඒ වෙනුවෙන් සිය ජීවිත පවා කැප කිරීමට ඔවුන් පසුබට නොවෙයි. කෙසේ නමුදු මානව සමාජය ශිෂ්ටාචාරගත වීමේ පටන් ඔවුන් හා බැඳී පැවති ආගම් හා විශ්වාස කාලයාගේ ඇවෑමෙන් පරිහානියට හා බිඳවැටීමට ලක්ව තිබේ. ඒ සඳහා බලපෑ කරුණු සමාජ පරිසරවලට අනුව විවිධත්වයකින් යුක්ත වෙයි. මානවයාට අතිශයින් සංවේදී දහමක් වූ බුදුසමය ඉන්දියාවෙහි පරිහානියට පත්වීම සැබවින් ම අධ්‍යයනය කළ යුතු කරුණක්ව පවතී. මෙම කරුණ සම්බන්ධයෙන් ඉන්දියාවේ මෙන්ම ලෝකයේ බොහෝ උගතුන් විවිධාකාරයෙන් අධ්‍යයනය කර ඇති නමුත් ඔවුන් අතින් ගිලිහිගිය කරුණු ද දක්නට පුළුවන. ඔවුන් අතින් මඟහැරුණු කරුණුවලට අවධානය යොමු කරමින් ඔවුන් පෙන්වාදෙන කරුණු ද විචාරශීලිව අධ්‍යයනය කරමින් මෙම පර්යේෂණය ඉදිරියට පවත්වාගෙන යා යුතුව තිබේ.

ක්‍රි. පූ. හයවන සියවසේ භාරතය නිජබිම කරගත් බුදුසමය සියවස් කිහිපයක් තුළ අතිශයින් ජනප්‍රිය වූවා සේම එය ඉතා ඉක්මනින් ඉන්දියාවෙන් වෙන්ව යාමේ තර්ජනයට ද මුහුණ දුන්නේ ය. බුදුදහම එසේ තර්ජනයට ලක්වූයේ ඉන්දියාවේදී පමණක් නොවන අතර ආසියාවේ බොහෝ රටවල දී එය විවිධ තර්ජනයන්ට ලක්වී පරිහානියට පත්විය. බුදුදහම එසේ පරිහානියටත් බිඳ වැටීමටත් හේතු වූ කරුණු අභ්‍යන්තරික හා බාහිර වශයෙන් දෙපරිදිය. බුදුදහම උපන් නිජ බිමෙන් පරිහානියට පත්ව අතුරුදහන් වූයේ ඇයි ද යන්න මූලාශ්‍රගත කරුණු විචාරශීලව අධ්‍යයනය කළ යුතු වන්නේ එනිසාය. එය බෞද්ධ ලෝකයට අතිශයින් වැදගත් පණිවිඩයක් ලබාදේ. ආගමික සහනශීලි ප්‍රතිපදාව හමුවේ බුදුදහම මුහුණ දෙන පසුගාමී තත්ත්වය හා එයට අභ්‍යන්තරයෙන් හා බාහිරව එල්ලවන අභියෝග කවරේ ද යන්න අවබෝධ කරගත හැකිව පවතින අතර එයින් අවශ්‍ය කරන පිළියම් යෙදිය හැකිව පවතී. එය බෞද්ධ ලෝකයට මෙන්ම සමස්ත මානව සමාජයට ම අතිශයින් වැදගත් වනු ඇත.

## පර්යේෂණ ගැටලුව

ඉන්දීය බුදුසමයේ පරිහානිය කෙසේ සිදුවී ද ඒ සඳහා බලපෑ හේතු සාධක කවරේ ද?

---

[1] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍ර මත පදනම්ව ඇති අතර එම මූලාශ්‍රවල එන තොරතුරු තව දුරටත් සනාථ කර ගැනීම සඳහා ඉන්දීය පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර ද භාවිත කරනු ලැබේ. විශේෂයෙන් ඉන්දියාවේ ශේෂව පවතින පුරාවිද්‍යාත්මක නෂ්ඨාවශේෂ අනුසාරයෙන් බුදුසමය ඉන්දියාවේදී මුහුණ දුන් අභියෝග හා අන්‍යාගමික බලපෑම් කවරේ ද යන්න අවබෝධ කරගත හැකිය. සාහිත්‍ය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයවල එන කරුණු සංසන්දනාත්මක විමසීමට ලක් කිරීම මෙහි ක්‍රමවේදයයි.

**පර්යේෂණයේ වැදගත්කම**

බුදුසමය යනු නූතනය වන විට ලෝකව්‍යාප්ත දහමක් බවට පත්ව තිබේ. එසේ ලෝක ව්‍යාප්ත බුදුසමයේ නිජබිම ඉන්දියාවයි. සිය නිජබිම වූ ඉන්දියාවෙන් බුදුසමය කාලයාගේ ඇවෑමෙන් පරිහානියට පත්විය. එසේ පරිහානිය කරා ගමන් කිරීමේ දී විවිධ සාධක ඒ සඳහා බලපෑ බව විවිධ පර්යේෂණ තුළින් පෙන්නුම් කර තිබේ. එම කරුණු හා මෙම පර්යේෂණය තුළින් අනාවරණය කරගන්නා කරුණු තව දුරටත් විමසුමට බඳුන් කර සැබවින් ම ඉන්දියාවෙන් බුදුසමය නිරුද්ධ වූයේ කුමන තත්ත්වයන් යටතේ ද යන්න අවබෝධ කරගැනීම බෙහෙවින් වැදගත් වෙයි. එය බෙහෙවින් වැදගත් වනුයේ නූතනයේ බුදුසමය රාජ්‍ය ආගම බවට පත්ව ඇති රාජ්‍යන්වලටය. බුදුසමය තව දුරටත් සිය රටවල් තුළ ස්ථාවර කර ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග කවරේ ද සිය දහමට අභ්‍යන්තර වශයෙන් මෙන් ම බාහිරව එල්ල වන අභියෝග කවරේ ද යන්න එයින් අවබෝධකර ගත හැකිය.

**සාකච්ඡාව**

බුදුසමයේ උපන් තිඹිරි ගෙය වූ භාරත දේශයෙන් බුදුසමය ඉතා සීඝ්‍රයෙන් පරිහානියටත් අභාවයටත් පත්වීම සඳහා බලපෑ කරුණු කවරේ ද යන්න නූතනය වන විටත් උගතුන් අතර පවතින සංවාදශීලි කරුණක් බවට පත්ව තිබේ. බුදුන් වහන්සේ සතුව පැවති නායකත්ව පෞරුෂත්වය මෙන් ම තත් කාලීන පාලක ප්‍රජාව හා සිටුවරු ආදි සමාජ කණ්ඩායම්වලින් ලැබුණු අනුග්‍රහශීලි දායකත්වය නිසා ක්‍රි. පූ. හයවන සියවසේ දී බුදුසමය ඉතා සීඝ්‍රයෙන් භාරතයේ බොහෝ ප්‍රදේශවල ව්‍යාප්ත විය.

සියවස් තුනක් පමණ භාරතයේ ප්‍රධාන ආගම ලෙසින් ඉදිරියට පැමිණි බුදුසමය ධර්මාශෝක අධිරාජයාගේ අවධියෙන් පසුව ක්‍රමාණුකූලව පරිහානිය කරා ගමන් කළ ආකාරයක් දැකගත හැකිය. ඇතැම් විද්වතුන් පෙන්වා දෙන ආකාරයට ඉන්දියාවේ බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ පළමු කරුණ වනුයේ අශෝක අධිරාජයා විසින් ගෙන ගිය අන්‍යාගමික සහනශීලි ප්‍රතිපත්තියයි. මෙයට අමතරව බෞද්ධයන් තුළම පැවති අභ්‍යන්තරික දුර්වලතා සේමසංඝයා අතර පැවති භේද භින්නතා, පාලක ප්‍රජාවගෙන් එල්ල වූ පීඩනයන්, ආර්ථිකමය වශයෙන් බෞද්ධයන් දුර්වල වීම, මධ්‍යකාලීන ඉන්දියාවේ පැවති නොයෙක් විශ්වාසයන් බුදුසමයට

ඇතුළත් වීම, හින්දු හා බෞද්ධ දෙපක්ෂය අතර ආගමික විශ්වාස පදනම් කරගෙන ඇතිව තිබූ තරඟකාරිත්වය, භික්ෂූන් සුඛෝපභෝගී ජීවිතයට හුරුවීම, බෞද්ධ ප්‍රතිමා වන්දනය, සංස්කෘත භාෂාව බුදුදහමේ ප්‍රචාරය සඳහා යොදා ගැනීම,මුස්ලිම් ආක්‍රමණිකයන් වෙතින් එල්ල වූ පීඩනයන් වැනි කරුණු රැසක් ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ බව විද්වතුන්ගේ අදහස වී තිබේ.

ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ කරුණු මේ ආකාරයෙන් විවිධ ස්වරූපයෙන් ගෙනහැර දැක්වෙන අතර මේ සඳහා බලපෑ තවත් කරුණු රැසක් ඇති බව පැරණි මූලාශ්‍ර පිරික්සීමෙන් පැහැදිලි වෙයි. ඉන්දීය බුදුසමයේ පරිහානිය සඳහා බලපෑ කරුණු තව දුරටත් සංවාදශීලීව විමසමින් පැරණි මූලාශ්‍රය ඇසුරු කරගෙන ඒ සඳහා බලපෑ අනෙක් කරුණු කවරේ ද යන්න විචාරශීලව අධ්‍යයනය කිරීම මෙතුළින් සිදු කෙරේ.

### නිගමනය

භාරතීය බුදුසමයේ පරිහානිය එක්වර හෝ සියවසක් තුළ සිදු වූවක් නොවෙයි. එය අභ්‍යන්තරයේ මෙන් ම බාහිරින් එල්ල වූ උක්ත හේතූන් මෙන්ම විවිධ සංස්කෘතික හේතු සාධකයන්ගේ ද පූජා චාරිත්‍ර හා ආක්‍රමණික ක්‍රියාදාමයන් රැසක ද ප්‍රතිඵලයන් නිසා සිදුවිය.

ප්‍රමුඛ පද: ඉන්දියාව, බුදු සමය, පරිහානිය, මූලාශ්‍රය

### ආශ්‍රිත ග්‍රන්ථ

බෂාම්, ඒ. එල්. (1965). *අසිරිමත් ඉන්දියාව.* කොළඹ: අධ්‍යයන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

බාප්ට්, ජී.වී. (2016). (සංස්.) ගුණසේකර, පද්මා. *දෙදහස් පන්සිය වසරක බොදුසමය.* නුගේගොඩ: සුනෙර ප්‍රකාශකයෝ.

සාසනරතන හිමි, මොරටුවේ. (1962). *ලක්දිව මහායාන අදහස්.* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

විජේසිංහ, ඩබ්.ජී.පී. (2004). *බෞද්ධ සංස්කෘතියේ භූගෝලීය ව්‍යාප්තිය.* අංක 01, වැලිවේරිය: සමාධි කම්පියුටර් ග්‍රැෆික්ස්.

විජේරත්න, ආනන්ද, (2004), *ශ්‍රමණ සම්ප්‍රදාය,* වැලිවේරිය: සමාධි කම්පියුටර් ග්‍රැෆික්.